## සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

### දෙසැම්බර් 03 වන සතිය - බුද්ධ ධර්මය - 1 ශ්‍රේණිය

සැකසුම - ජේ.ඒ.ඩී. කෞශල්‍යා - ර/බළ/රංවල මහ විද්‍යාලය

**පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි එක්ක එකතු වෙලා පෙළ පොතේ පාඩම් ටික කියවන්න.මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර කියනන්න.**

1. අපි කළ යුතු හොඳ වැඩ ලස්සනට පාට කරන්න.

| | |
|---|---|
| වැඩිහිටියන්ට සලකමු | පරිසරයට ආදරය කරමු |
| හොඳ වචන කතා කරමු | සොරකම් කරමු |

2. අප කළ යුතු හොඳ වැඩ 2ක් කියන්න.
3. පහත කවිය තාලයට ගායනා කරමු. මේ කවියෙන් කියවෙන වෙහෙර වහන්සේ කුමක් ?

රුවන්මැලිය සිත සනසනවා
ගැමුණු රජුන් මට සිහි වෙනවා
දොහොත් මුදුන් දී නමදිනවා
බුදු ගුණ ලොවට ම සෙත දෙනවා

4. දළඳා පෙරහැරේ දළඳා කරඬුව ගෙන යන්නේ කවුද?

මෙම කියමන් හරි නම් හරි බව ද වැරදි නම් වැරදි බව ද කියන්න.

5. පන්සලට ඇතුළු වීමට පෙර හිස්වැසුම් හා පාවහන් ගැලවිය යුතු ය.
6. වැඩිහිටියන්ට සැලකීම යහපත් දෙයකි.
7. අපි පොසොන් පෝයට වෙසක් කූඩු හදනවා.
8. දේවානම්පියතිස්ස රජතුමා වෙහෙර විහාර හැදුවා.
9. උදැසනින් අවදි වීම හොඳ දරුවෙකුගේ ලක්ෂණයක් නොවේ.
10. පළමුව වෙහෙර වහන්සේ වන්දනා කළ යුතු ය.

සැම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !